# ජේ.පී.ජී.යු. කන්ටෝ / යුනි ඇප්රෝ ශිෂ්‍යත්ව වැඩ සටහන
## නවවන පියවර - 2019

විශිෂ්ඨ ලෙස අ.පො. ස. (සා.පෙ) හා අ.පො.ස (උ.පෙ.) විභාග කඩ ඉම ජයගත් තැපැල් හා විදුලි සංදේශ නිලධාරීන්ගේ සංගමයේ හා ජාතික තැපැල් හා විදුලි සංදේශ සේවක සංගමයේ සාමජික සාමාජිකාවන්ගේ දූ දරුවන් හට සිය උසස් පෙළ අධ්‍යාපන කටයුතු හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් දිරිදීම සඳහා යුනි ජාත්‍යාන්තරයේ මෙහෙයවීමෙන් ජපන් තැපැල් සේවක සංගමය විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ 08 වන පියවර යුනි ජාත්‍යාන්තරයේ නියෝජිතයින්, ජපන් තැපැල් සේවක සංගමය (JPGU KANTO) හා එක්ව උත්සවාකාරයෙන් 2017 වර්ෂයේදී පවත්වනු ලැබීය.

මෙවර මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයේ 09 වන පියවර ක්‍රියාත්මක කරනු සඳහා යුනි ආසියා හා ශාන්තිකර කලාපයේ මූල්‍ය අංශය, වෘත්තිය හා කළමණාකරන කාණ්ඩ ක්‍රියාකාරි අංශ අධ්‍යක්ෂ ජය ශ්‍රී ප්‍රියලාල් සොයුරාගේ මැදිහත්වීම සහ ශිෂ්‍යත්ව කමිටු සභාපති වශයෙන් දක්වන ලද උත්සහයට අනුව තැපැල් හා විදුලි සංදේශ නිලධාරීන්ගේ සංගමයේ, ජාතික තැපැල් හා විදුලි සංදේශ සේවක සංගමයේ හා ශ්‍රී ලංකා තැපැල් හා විදුලි සංදේශ සේවා සංගමයේ සාමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන්ට මෙම ශිෂ්‍යත්වය නැවත වාරයක් ලබාදීමට එකගතාවය ලැබී ඇති බව සතුටින් දන්වා සිටිමු.

ඒ සම්බන්ධයෙන් ජපන් තැපැල් සේවක සංගමය (JPGU KANTO) හා යුනි ආසියා හා ශාන්තිකර කලාපයේ මූල්‍ය අංශය, වෘත්තිය හා කළමණාකරන කාණ්ඩ ක්‍රියාකාරි අංශයේ අධ්‍යක්ෂ ජය ශ්‍රී ප්‍රියලාල් සොයුරා ට අපගේ ගෞරවණීය ස්තුතිය පුදකරමු.

මෙම ශිෂ්‍යත්ව වැඩසටහනට මෙවර කණ්ඩායම් දෙකක් යටතේ අයදුම් කල හැක.

| | |
|---|---|
| පළමු කණ්ඩායම (A) | 2016 හා 2017 වර්ෂයන් හි අ.පො. ස. සා(පෙ.ළ) විභාගය සඳහා පළමු වරට පෙනී සිට 2019 හා 2020 වර්ෂවල අගෝස්තු මස අ.පො.ස (උ.පෙ.) විභාගය සඳහා පළමුවරට පෙනී සිටින සිසුන් කණ්ඩායම |
| දෙවන කණ්ඩායම (B) | ශිෂ්‍යත්ව ආරම්භක දින සිට අවම වශයෙන් අවුරුදු දෙකක කාලසීමාවක් තුළ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබන හෝ එදිනට විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තේරී ඇති බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ලිපිය මගින් දන්වා ඇති සිසුන් කණ්ඩායම. |

**ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.**

- **අධ්‍යාපන සුදුසුකම්**
- **ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලින් දිනාගත් සම්මාන හා කුසලතා**
- **සම්මුඛ/ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු**
- **ඉල්ලුම්කරුගේ දෙමාපියන්ගේ ආර්ථික තත්වය**
- **බාහිර ක්‍රියාකාරකම් හා කුසලතා දිනාගත් සම්මාන සහ පවුලේ ඉගෙනුම ලබන සාමාජිකයින්**



**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.**

- **එක් සාමාජික පවුලකින් ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක් පමණක් මෙම වැඩ සටහනට ඉදිරිපත් කළ යුතුය.**

- **තැ.වි.නි.ස, ජා.තැ.වි.සේ. ස. සහ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස. සමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන් සඳහා පමණක් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක වේ.**

- තැ.වි.නි.ස, ජා.තැ.වි.සේ. ස. සහ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස සාමාජිකයා ගේ හා පවුලේ අනෙක් අය රැකියා කරන්නේ නම් ඔවුන්ගේ ආයතන/ අංශ ප්‍රධානියා විසින් සහතික කළ වැටුප් විස්තරයක් එවිය යුතුවේ.

- සත්‍ය පිටපතක් බවට විදුහල්පතිතුමා /තුමිය සහතික කළ අ.පො.ස (සා.පෙ) හා අ.පො.ස. (උ.පෙල) සහතිකවල ඡායා පිටපත් හා ජාතික මට්ටමේ ජාතික සම්මාන කුසලතා සහ බාහිර ක්‍රියාකාරකම් පිළිබද සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.

- පසුගිය වසර වල ශිෂ්‍යත්වලාභී පවුල්වලට නැවත වරක් ඉල්ලුම් කල නොහැක.

- ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීම සදහා තැ.වි.නි.ස, ජා.තැ.වි.සේ. ස. හෝ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස සාමාජිකත්වය වසර දෙකක් සම්පූර්ණ විය යුතුය.

මෙවර මෙම ශිෂ්‍යත්ව සදහා අන්තර්ජාලය හරහා **UNI SLAC** වෙබ් අඩවිය වන www.unisrilanka.org හි ලියාපදිංචි විය යුතුය. ඉන් අනතුරුව එම අයදුම් පත්‍රයේ පිටපතක් සමග සියළුම ලේඛණ වල පිටපත් අදාල වෘත්තිය සමිතියේ ශාඛා ලේකම්ගේ නිර්දේශය සහිතව අදාල වෘත්තිය සමිතියේ ප්‍රධාන ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියා පදිංචි කිරීම ආරම්භ වන දිනය හා අවසන් වන දිනය ඉදිරියේදී දැනුම්දීමට කටයුතු කරනු ඇත.

.

එච්. කේ. කාරියවසම්
ලේකම්
ජේ. පී. ජී. යූ. කන්ටෝර්/යුනි
ඇප්රෝ ශිෂ්‍යත්ව කමිටුව

තැපැල් හා විදුලි සංදේශ නිලධාරීන්ගේ සංගමය,
ජාතික තැපැල් හා විදුලි සංදේශ සේවක සංගමය,
ශ්‍රීලංකා තැපැල් හා විදුලි සංදේශ සේවා සංගමය,
සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,

## ජේ.පී.ජී.යු. කන්ටෝ / යුනි ඇප්රෝ ශිෂ්‍යත්ව වැඩ සටහන
## <u>නවවන පියවර2019</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත එවන ලද දැනුවත් කිරීමේ ලිපියට අමතරවයි.

මෙවර ද මෙම ශිෂ්‍යත්ව සඳහා අන්තර්ජාලය හරහා **UNI SLAC** වෙබ් අඩවිය වන www.unisrilanka.org හි ලියාපදිංචි විය යුතු අතර 2018 ඔක්තෝබර් මස 01 වන දින සිට ඔක්තෝබර් මස 14 වන දින දක්වා මෙම වෙබ් අඩවිය හරහා ලියාපදිංචි විය හැකි බව දන්වා සිටිමු.
සම්පූර්ණ කරන අයදුම් පත්‍රයේ පිටපතක් සමග සියළුම ලේඛණ වල පිටපත් අදාල වෘත්තිය සමිතියේ ශාඛා ලේකම්ගේ නිර්දේශය සහිතව අදාල වෘත්තිය සමිතියේ ප්‍රධාන ලේකම් වෙත <u>2018 ඔක්තෝබර් 14 දින හෝ ඊට ප්‍රථම</u> ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ.

<u>ඉහත ශිෂ්‍යත්ව වැඩ සටහනට අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු බව දන්වමු.</u>

- එක් සාමාජික පවුලකින් එක් ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යාවක් පමණක් මෙම වැඩ සටහනට ඉදිරිපත් කළ යුතුය.
- තැ.වි.නි.ස" ජා.තැ.වි.සේ. ස. සහ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස. සාමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන් සඳහා පමණක් මෙම ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක වේ.
- තැ.වි.නි.ස, ජා.තැ.වි.සේ. ස. සහ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස සාමාජිකයා ගේ හා පවුලේ අනෙක් අය රැකියා කරන්නේ නම් ඔවුන්ගේ ආයතන/ අංශ ප්‍රධානියා විසින් සහතික කළ වැටුප් විස්තරයක් එවිය යුතුවේ.
- සත්‍ය පිටපතක් බවට විදුහල්පතිතුමා /තුමිය සහතික කළ අ.පො.ස (සා.පෙ) හා අ.පො.ස. (උ.පෙළ) සහතිකවල ඡායා පිටපත් හා ජාතික මට්ටමේ ජාතික සම්මාන කුසලතා සහ බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය.
- ශිෂ්‍යත්වය ආරම්භක දින සිට අවම වශයෙන් ඉදිරියට අවුරුදු දෙකක කාල සීමාවක් තුළ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබන සිසුන් එම විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු බවට ලේඛකාධිකාරිගෙන් ලබා ගත් ලිපියක් ද විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තේරී ඇති සිසුන් ඒ බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වා එවා ඇති ලිපියේ පිටපතක් ද ඉදිරිපත් කල යුතුය.
- පසුගිය වසර වල ශිෂ්‍යත්වලාභී පවුල්වලට නැවත වරක් ඉල්ලුම් කල නොහැක.
- ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීම සඳහා තැ.වි.නි.ස, ජා.තැ.වි.සේ. ස. හෝ ශ්‍රී.ලං.තැ.වි.සේ.ස සාමාජිකත්වය වසර දෙකක් සම්පූර්ණ විය යුතුය.

එච්. කේ. කාරියවසම්
ලේකම්
ජේ. පී. ජී. යු. කන්ටෝ/යුනි
ඇප්රෝ ශිෂ්‍යත්ව කමිටුව